## පස්ගොඩ ප්‍රාදේශිය සභාව.

## මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ඔක්තෝබර් 14 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන වල පෙර ගෙවුම් යටතේ පෙන්වා දී ඇති රු.947,500 ක ශේෂය ජර්නල් සටහන් අංක 1 මගින් ලෙජරයේ අත්තිකාරම් ලෙස සටහන් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,353,304 ක දායක මුදල මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල් පොත (ප්‍රා.ස. 10) අනුව ශේෂය හා විගණනයේදී ප්‍රධාන මුදල් පොතේ ලැබීම්, ගෙවීම් ගණනය කිරීමෙන් ලබාගත් ශේෂය අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| ගිණුම් අංකය | විගණනයේදී ගණනය කර ලබාගත් ශේෂය | ප්‍රධාන මුදල් පොත අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 394 | (6,950) | 46,332 | 39,382 |
| 403 | (1,657,218) | 726,850 | 930,368 |

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු. 29,746 ක අතැති මුදල් මූල්‍ය ප්‍රකාශන වල නොදක්වා බැංකු සැසඳුමේ දක්වා තිබුණි.

1.3.2 හඳුනා නොගත් ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන වල පෙර ගෙවුම් යටතේ සභාවේ තැන්පත් ලෙස රු.92,810 ක් හඳුනාගැනීමකින් තොරව දිගින් දිගටම සටහන් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට අංක 403,405,642,394 දරණ බැංකු ගිණුම්වල රු. 17.045 ක් වූ හර සහ රු.48,240 ක් වූ බැර සටහන් ගිණුම් ගැලපුම් කිරීමකින් තොරව සැසඳුම් ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්.

ගිණුම් විෂයයන් 06 කට අදාලව මල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.1,862,843 ක් වූ අතර උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු.2,309,325 ක් වූයෙන් රු.446,482 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 ගෙවිය යුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.25,691,632 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිත් නොකිරීම නිසා එකතුව රු. 38,205,338 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධි විධාන වලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 163 | වාර්ෂික ආදායම් සාරාංශය (ප්‍රා.ස. 19) සකස් කර නොතිබුණි. |
| (ii) රීති 180-184 | මුදල් හා ගබඩා කටයුතු සම්බන්ධව ක්‍රියා කරන නිලධාරීන්ගෙන් ලබාගෙන තිබූ ඇප මුදල් බැංකුවක ආයෝජනය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 485 (4) | ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 20,143 ක සේවක ණය මුදල මාරුවී ගිය ආයතන වලින් ගෙන්වා ගෙන නොතිබුණි. |
| (ii) මු.රෙ. 1645-1646 | වාහනවල ධාවන සටහන් නිසි පරිදි සම්පූර්ණ කර මාසික සාරාංශ සමඟ ඊළඟ මාසයෙ 15 දිනට පෙර විගණකාධිපති |

වෙත එවිය යුතු වුවත් වාහන 04 ක් සම්බන්ධයෙන් එසේ එවා නොතිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදය 4.4, 4.5, හා 4.6.

යොමුගත උපදෙස් පරිදි මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.9,663 ක් වූ සේවක ණය හිඟ ශේෂය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ.

2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි - 2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය

පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,056,128 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.1,550,441 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළබඳ තොරතුරු 2011 මාර්තු 03 දිනැති මාගේ ලිපියට අනුව නියමිත අකෘතියක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබූ නමුත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශ අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| විස්තරය | හිඟ ආදායම | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | 2010 | 2009 | % |
| | රු.'000 | රු.'000 | |
| අක්කර බදු | 169 | 150 | 12.66 |
| වෙනත් ආදායම් | 32,228 | 11,955 | 169.58 |

#### 2.2.2 හිඟ බදු හා ගාස්තු

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව අයවිය යුතු රු.168,575 ක හිඟ බදු හා ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ දෙකකින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.650,009 ක් වූ දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.1,195,000 ක්ද, මධ්‍යම රජයෙන් රු. 92,855 ක්ද මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 13,285 | 10,151 | 3,134 | 6,019 | 10,534 | (4,515) |
| අනෙකුත් | 8,260 | 5,538 | 2,722 | 2,538 | 5,418 | (2,880) |
| උප එකතුව | 21,545 | 15,689 | 5,856 | 8,557 | 15,952 | (7,395) |
| ප්‍රාග්ධන වියදම | 14,377 | 47,761 | (33,384) | 10,155 | 29,183 | (19,028) |
| මුළු එකතුව | 35,922 | 63,450 | (27,528) | 18,712 | 45,135 | (26,423) |

2.4 මානව සම්පත් කළමනාකරණය.

2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 03 | 02 |
| ද්විතියික | 13 | 10 |
| ප්‍රාථමික | 21 | 19 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 17 |
| | 37 | 48 |

(ආ) සමලෝචිත වර්ෂයට අදාල කාර්ය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා පිරිවැය රු.10,151,206 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ ඉන් රු.9,153,000 ක් පමණක් හෙයින් සභාවට රු.998,206 ක අතිරේක වැය බරක් ඇති වී තිබුණි.

(ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 අංක 14, හා 2006 අප්‍රේල් 10, අංක 28 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛ මගින් පළාත් පාලන ආයතනවල අනියම්, තාවකාලික, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධානයට පටහැනිව සේවකයන් 17 ක් බඳවා ගෙන සහා අරමුදලින් වැටුප් වශයෙන් රු.2,008,498 ක මුදලක් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකල හොත් අදාල ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය.

2.5.1 ලැබිය යුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,040,310 ක් විය.

2.5.2 අයවීමට ඇති සේවක ණය.

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.171,916 ක් වූ අතර වර්ෂ 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.20,143 ක් විය.

2.6 ගොඩනැගිලි අයදුම්පත්.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරණ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ගොඩනැගිලි අයදුම්පත් දෙකකින් රු.1,110 ක පෙරසැරි ගාස්තු අඩුවෙන් අයකර තිබුණි.

(ආ) අංක BA/2010/02 දරන ගොඩනැගිලි අයදුම්පතේ සඳහන් ඉදිකිරීම් නිමකර ව්‍යාපාරික කටයුතු කරමින් තිබුණද රු.3,000 ක අනුකූලතා ගාස්තු අයකර නොතිබුණි.

(ඇ) අංක BA/2010/04 දරන ගොඩනැගිලි අයදුම්පත සඳහා සංවර්ධන බලපත්‍රයක් නිකුත් කර නොතිබූ අතර ඉහත ගැසට් නිවේදනයේ 6 (ii) ඡේදය පරිදි වර්ග මීටර් 48.3 ක් සඳහා වර්ග මීටරයට රු.2,000 බැගින් අයකර ගත යුතු රු.96,600 ක ආවරණ අනුමැතිය දීමේ ගාස්තු අයකර නොතිබුණි.

2.7 ඉදිකිරීම් කර්මාන්ත

සමාලෝචිත වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ මාර්ග තුනක් සංවර්ධනය සඳහා සභාව වෙත රු.75,000 ක මුදල් ලැබී තිබුණද 2011 නොවැම්බර් 21 දින වන විටද ගිවිසුම් අත්සන් කර හෝ වැඩ ආරම්භ කර හෝ නොතිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය

සභාව තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි.

3. පද්ධති හා පාලන.

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය